| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2023 |
| **11 ශ්‍රේණිය** | **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I** |

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 1 යි

**උපදෙස්**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**

---

වර්තමානයේ ව්‍යාපාර විසින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර බෙදා හරින ආකාරයත්, මිනිසා විසින් සිය අවශ්‍යතා හා වුවමනා සපුරා ගන්නා ආකාරයත් විවිධ හා සංකීර්ණ වී ඇත.

01) අවශ්‍යතා හා වුවමනාවල ලක්ෂණ පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.
   1) පොදු හා සීමිත වීම.
   2) අත්‍යාවශ්‍ය වීම හා අසීමිත වීම.
   3) විවිධ හා සංකීර්ණ වීම.
   4) අත්‍යවශ්‍ය වීම හා පොදු වීම.

02) ව්‍යාපාරයක පොදුවේ දැකිය හැකි ප්‍රධාන අරමුණක් නොවන පිළිතුරු තෝරන්න.
   1) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමයි.
   2) රැකියා උත්පාදනයයි.
   3) ලාභ ඉපයීම
   4) සමාජ සුභසාධනයයි.

03) භාණ්ඩ නිෂ්පාදනය ව්‍යාපාරයකට උදාහරණයකි.
   1) රූපලාවන්‍ය ආයතන
   2) ආහාරපාන නිෂ්පාදනය
   3) බැංකු ආයතන
   4) තොග වෙළඳ ආයතන

04) මිනිස් අවශ්‍යතාවලට උදාහරණයකි.
   1) තට්ටු නිවාස
   2) පාවහන්
   3) අධ්‍යාපනය
   4) බත්

05) ව්‍යාපාරය කෙරෙහි බලපාන බාහිර පරිසර සාධක කීපයක් පහත දක්වේ. ඒ අතරින් රැකියා නියුක්තිය අයත් වන්නේ කුමන පරිසරයට ද?
   1) දේශපාලන පරිසරයට
   2) නෛතික පරිසරයට
   3) තාක්ෂණික පරිසරයට
   4) ආර්ථික පරිසරයට

06) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමකි.
   1) ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබා ගත හැකි වීම.
   2) විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.
   3) දැඩි තරඟකාරිත්වයකට මුහුණ දීමට සිදුවීම.
   4) කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකි වීම.

07) ව්‍යාපාරයක පරිමාණය තීරණය කිරීමේ දී බලපාන ප්‍රධානම සාධකයකි.
   1) ලාභ ලැබීමේ අරමුණ
   2) යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රමාණය
   3) ව්‍යාපාරය නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය
   4) අයිතිකරුගේ මූල්‍ය ශක්තිය

08) තනිපුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචියට අදළ බලධාරියා වන්නේ
   1) ව්‍යාපාර නාම රෙජිස්ට්‍රර්ය
   2) සමාගම් රෙජිස්ටාර් ය
   3) ප්‍රාදේශීය ලේකම් ය
   4) ග්‍රාම නිළධාරිවරයාය

09) රු.1,000කට වැඩි ප්‍රාග්ධනයක් ඇත්නම් ලිඛිත හවුල් ගිවිසුමක් තිබිය යුතු යැයි හැඳින්වෙන පනත කුමක්ද?
   1) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත
   2) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත
   3) 2007 අංක 07 දරණ සමාගම් පනත
   4) 1940 වංචා වැළැක්වීමේ ආඥා පනත

10) පහත දැක්වෙන්නේ තොග වෙළඳාමේ හා සිල්ලර වෙළඳාමේ ලක්ෂණ කීපයකි.

A- අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ විකුණයි.
B- භාණ්ඩ වර්ග සීමිත සංඛ්‍යාවක් අලෙවි කරයි.
C- භාණ්ඩයේ මිල සාපේක්ෂව වැඩි වේ.
D- වෙළඳ වට්ටම් හිමි නොවේ.
E- වෙළඳ වට්ටම් හිමි වේ.
F- විවිධ වර්ගවල භාණ්ඩ විකිණීම.

ඉහත ලක්ෂණ අතරින් සිල්ලර වෙළඳාමට අයත් ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ
   1) A B C D
   2) A C D F
   3) B C E F
   4) B C E F

11) චෙක්පතක මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් සහිතව හෝ රහිතව බැංකුවක නමක් සඳහන් කිරීම හඳුන්වන්නේ
   1) සාමාන්‍ය රේඛනය නමිනි
   2) විශේෂ රේඛනය නමිනි
   3) පිටසන් කිරීම නමිනි
   4) චෙක්පත් පැවරීම නමිනි

12) ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් බලනොපාන මූලධර්මය වන්නේ
   1) උපරිම විශ්වාසයයි
   2) හානිපූරණයයි
   3) රක්ෂණ ගිවිසුමයි
   4) රක්ෂණ හිමිකමයි

13) සන්නිවේදනයට අදළ මූලිකාංග පහත දැක්වේ.

A- යවන්නා
B- මාධ්‍යය
C- ප්‍රතිචාරය
D- ලබන්නා
E- පණිවිඩය
F- ප්‍රතිපෝෂණය

ඉහත මූලිකාංග පිළිවෙළින් සැකසූ විට නිවැරදි පිළිතුර වන්නේ
   1) A B D E C F
   2) A B E D F
   3) A E B D C F
   4) A E D B C F

14) එකවර භාණ්ඩ හා මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි සාපේක්ෂව ප්‍රවාහන ගාස්තු අඩු ජාත්‍යන්තර වෙළඳාම සඳහා පිටිවහලක් වන ප්‍රවාහන මාර්ගය වනුයේ
   1) මහාමාර්ග
   2) දුම්රිය මාර්ග
   3) ගුවන් මාර්ග
   4) ජල මාර්ග

15) ව්‍යාපාරයක අරමුණු අපේක්ෂිත අයුරින් ඉටු කර ගැනීම හඳුන්වන්නේ
   1) සඵලදයකත්වය ලෙසටය
   2) ඵලදයකත්වය ලෙසටය
   3) කාර්යක්ෂමතාවය ලෙසටය
   4) කලමණාකරණය ලෙසටය

16) ව්‍යාපාර ආයතනයක් තම ආයතනයට අවශ්‍ය සේවකයින් සංඛ්‍යාව තීරණය කිරීම ………………… වන අතර, සේවකයින්ව තම කාර්යයන් නිසි ලෙස ඉටු කිරීමට පෙළඹවීම …………………. ලෙස හඳුන්වයි. හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු පිළිවෙලින් වනුයේ

1) සැලසුම්කරණය, මෙහෙයවීම
2) සංවිධානකරණය, අභිප්‍රේරණය
3) මෙහෙයවීම, පාලනය
4) සැලසුම්කරණය, පාලනය

17) පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) හිමිකම් ගිණුම් වැඩිවීම හර වන අතර අඩුවීම බැර වේ.
2) වත්කම් ගිණුම් වැඩිවීම හර වන අතර අඩු වීම බැර වේ.
3) වගකීම් ගිණුම වැඩිවීම හර වන අතර අඩුවීම බැර වේ.
4) ආදායම් ගිණුම වැඩිවීම හර වන අතර අඩු වීම බැර වේ.

18) ගැනිලි ගිණුම

1) වත්කම් ගිණුමකි
2) හිමිකම් ගිණුමකි
3) වගකීම් ගිණුමකි
4) ආදායම් ගිණුමකි

19) නිහාල් විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.7,000ක් වටිනා භාණ්ඩ තොගයක් ව්‍යාපාරයෙන් ලබා ගන්නා ලදි. මෙම ගණුදෙනුව සටහන් කරනු ලබන මූලික සටහන් පොත වන්නේ

1) ගැනුම් ජර්නලය යි
2) විකුණුම් ජර්නලය යි
3) මුදල් පොතයි
4) පොදු ජර්නලය යි

20) පහත දැක්වෙන කරුණු අතරින් වත්කමක දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ

1) ව්‍යාපාරයේ අභිමතය පරිදි පාලනය කළ හැකි වීම යි.
2) අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීමයි.
3) අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම යි.
4) වර්තමාන බැඳීමක් තිබීම යි.

21) තනුජගේ ව්‍යාපාරයේ 2023.08.31 සිදුවූ ගණුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| වත්කම් (රු) | = | හිමිකම් (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|
| -50 000 | = | | | -50 000 |

මෙම සමීකරණයට අනුව එදින සිදුවූයේ යැයි අපේක්ෂා කළ හැකි ගණුදෙනුව වන්නේ

1) රු.50 000 ක් වටිනා වූ භාණ්ඩ ණයට විකිණීමයි.
2) රු.50 000 ක් වටිනා වූ භාණ්ඩ ණයට ගැනීම යි.
3) ණයහිමියන්ට රු.50 000 ක් ගෙවීම යි.
4) අයිතිකරු විසින් ණයහිමියන්ට රු.50 000 ක් ගෙවීම යි.

22) ණයහිමියෙකුගෙන් ලද වට්ටම රු.1,500ක් මුදල් පොතේ වට්ටම් තීරුවේ රු.1,300ක් ලෙස සටහන්ව තිබීම නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ

1) ණයහිමි ගිණුම හර 200
ලද වට්ටම් ගිණුම බැර 200

2) ලද වට්ටම් ගිණුම හර 200
ණයහිමි ගිණුම බැර 200

3) ණයහිමි ගිණුම හර 1,500
ලද වට්ටම් ගිණුම බැර 1,300
මුදල් වට්ටම් ගිණුම බැර 200

4) ලද වට්ටම් ගිණුම හර 1,500
මුදල් ගිණුම බැර 1,300
ණයහිමි ගිණුම බැර 200

23) බෙද හැරීමේ වියදම්, පරිපාලන වියදම් යන මූල්‍ය වියදම් පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ
1) බොල්ණය, රක්ෂණ ගාස්තු, බැංකු අයිරා පොලී
2) බොල්ණය, දුන් වට්ටම්, බැංකු අයිරා පොලී
3) විකුණුම් කොමිස්, ලිපිද්‍රව්‍ය වියදම්, ගිනි හානි
4) කුලී ගෙවීම්, දුන් වට්ටම්, බැංකු ගාස්තු

24) මුදල් වට්ටම් සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1) ලද වට්ටම් ව්‍යාපාරයේ ආදායමක් ලෙස සැලකේ.
2) දුන් වට්ටම් ගිණුම වියදම් ගිණුම් වර්ගයට අයත් වේ.
3) ලද වට්ටම් මුදල් පොතේ බැර පැත්තේ මට්ටම් තීරුවේ සටහන් කරයි.
4) වෙළඳ වට්ටම් පමණක් ගිණුම්වල සටහන් කරනු ලබයි.

25) ණයගැතියෙකු බුන්වත් වීම නිසා ලැබිය යුතු මුදල බොල්ණය වශයෙන් කපා හැරීම ව්‍යාපාරයට,
1) ආදායමකි 2) වත්කමකි 3) වගකීමකි 4) වියදමකි

★ **පහත තොරතුරු ඇසුරින් 26, 27, 28 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ගයාන්ගේ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.
A- රු.80 000ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම්
B- රු.40 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු.45 000ට ණයට විකිණීම.
C- රු.30 000 ක් වටිනා භාණ්ඩ තොගයක් මිලදී ගැනීම.
D- රු.20 000 මුදලක් ණය හිමියන්ට ගෙවීම.

26) ඉහත ගනුදෙනු වලින් ගැනුම් ජර්නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ
1) A ය 2) B ය 3) C ය 4) D ය

27) ඉහත ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ වත්කම් කෙරෙහි පමණක් බලපෑම් ඇති කරනු ලබන ගනුදෙනුව වන්නේ
1) A ය 2) B ය 3) C ය 4) D ය

28) ගයාන්ගේ ව්‍යාපාරයේ මෙම ගනුදෙනු සිදුවීමට පෙර ණය හිමි ශේෂය රු.40 000ක් විය. ඉහත ගනුදෙනු සිදුවූ පසු ණයහිමියන්ගේ ශේෂය වනුයේ
1) රු.130 000 කි 2) රු.100 000 කි 3) රු.75 000 කි 4) රු. 95 000 කි

★ **පහත සඳහන් තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 29 හා 30ට පිළිතුරු සපයන්න.**

2023.01.01 දිනට මිනුතිගේ ව්‍යාපාරයේ සුළු මුදල් ශේෂය රු.470 කි. සුළු මුදල් වියදම්වල මුළු එකතුව රු.2530 කි.

29) ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණද?
1) රු.470 කි 2) රු.2,530 කි 3) රු.2,060 කි 4) රු.3,000 කි

30) 2023.01.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමට අදාළ ද්විත්ව සටහන කුමක්ද?
1) මුදල් පොත හර රු.2,530
සුළු මුදල් පොත බැර රු.2,530
2) සුළු මුදල් පොත හර රු.2,530
මුදල් පොත බැර රු.2,530
3) මුදල් පොත හර රු.2,060
සුළු මුදල් පොත බැර රු.2,060
4) මුදල් පොත හර රු.3,000
සුළු මුදල් පොත බැර රු.3,000

31) චෙක්පත් අගරු වීමට බලපාන හේතුවක් නොවන්නේ
   1) ජංගම ගිණුමේ මුදල් නොතිබීමයි.
   2) චෙක්පතට තබා ඇති අත්සන ආදර්ශ අත්සනට වඩා වෙනස්වීමයි.
   3) චෙක්පත අවිධිමත්ව ලියා තිබීමයි.
   4) චෙක්පතේ පිළිපත සම්පූර්ණ කර නොතිබීමයි.

සමිතගේ ව්‍යාපාරයේ 2023.07.31 දිනට බැංකු ගිණුමේ රු.23 000ක වාසිදයක ශේෂයක් පැවතිණි. එහෙත් බැංකු ප්‍රකාශනයේ දක්නට ලැබෙනුයේ වෙනත් ශේෂයකි. වෙනසට හේතු පහත දැක්වේ.

a) තැන්පත් කල නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු.18 000
b) නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් රු.15 000 කි.
c) බැංකු ගාස්තු රු.800
d) ණයගැති ප්‍රේෂණ රු.24 000කි

★ **ඉහත තොරතුරු ඇසුරින් 32, 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

32) බැංකු පොත සංශෝධනය කළ පසු නිවැරදි බැංකු ශේෂය වන්නේ
   1) රු.43 200    2) රු.46 200    3) රු.40 800    4) රු.40 000

33) බැංකු ප්‍රකාශනයට අනුව පැවති බැංකු ශේෂය වන්නේ
   1) රු.47 800    2) රු.40 000    3) රු.43 200    4) රු.46 200

34) සුමේධගේ ව්‍යාපාරයේ 2022.02.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව පහත දැක්වේ.
   ○ හර තීරුවේ එකතුව  රු.835 000    ○ බැර තීරුවේ එකතුව  රු.795 000

ඉහත තොරතුරු අනුව අවිනිශ්චිත ගිණුම සටහන් කළ යුත්තේ
   1) අවිනිශ්චිත ගිණුම හර රු.40 000 කි.
   2) අවිනිශ්චිත ගිණුම බැර රු.40 000 කි.
   3) අවිනිශ්චිත ගිණුම හර රු.835 000 කි.
   4) අවිනිශ්චිත ගිණුම බැර රු.795 000 කි.

35) ලැබිය යුතු ආදායම් (උපචිත ආදායම්) ව්‍යාපාරයට,
   1) වගකීමකි
   2) ආදායමකි
   3) වත්කමකි
   4) වියදමකි

★ **පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පමුදිගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුමෙන් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය | 450 000 |
| තොගය (2022.01.01 දිනට) | 80 000 |
| විකුණුම් | 340 000 |
| ගැනුම් | 175 000 |
| ගෙන ඒමේ කුලී | 15 000 |
| වැටුප් හා වේතන | 35 000 |
| ගොඩනැගිලි කුලී | 14 000 |
| ණය ගැතියෝ | 52 000 |
| බැංකු ණය පොලී | 12 000 |
| වෙනත් ආදයම් | 8 000 |
| දුන් වට්ටම් | 4 000 |

**අතිරේක තොරතුරු**

- 2022.12.31 දිනට ඉතිරි තොගය රු.60 000කි.
- 2022 වසර සඳහා ගොඩනැගිලි කුලී රු.6 000ක් ගෙවිය යුතුය.
- ණයගැතියන්ගෙන් රු.2 000 ක් බොල් ණය ලෙස කපා හැරිය යුතුය.

36) 2022.12.31 දිනට විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය වන්නේ

1) රු.270 000 කි 2) රු.210 000 කි 3) රු.255 000 කි 4) රු.195 000 කි

37) මෙම ව්‍යාපාරයේ 2022.12.31 දිනට විකුණුම් පිරිවැය වන්නේ

1) රු.130 000 කි 2) රු.210 000 කි 3) රු.115 000 කි 4) රු.195 000 කි

38) මෙම ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වසරේ ශුද්ධ ලාභය වනුයේ

1) රු.57 000 කි 2) රු.65 000 කි 3) රු.49 000 කි 4) රු.63 000 කි

39) 2022.02.31 දිනට මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ මුළු හිමිකම කොපමණද?

1) රු.450 000 කි 2) රු.580 000 කි 3) රු.515 000 කි 4) රු.507 000 කි

40) මෙම ව්‍යාපාරයේ 2022.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු ණයගැති වටිනාකම

1) රු.52 000 කි 2) රු.50 000 කි 3) රු.56 000 කි 4) රු.54 000 කි